## සඤ්ඤාපනය

කුඩා දරුවනට අකුරු කියවන පාඩම් පොත් පෙළේ දෙවැන්න නම් පොත ය. හෝඩිය කියැවූ පසු අකුරු කිහිපයක් එක් කොට තැනූ වචන කියැවීම හුරු කරනු පිණිස මෙය පැරැණි පන්සල් පාසල් හි භාවිත විය. මෙය මුලදී රචිතව ඇත්තේ සති පිරිත් අවසනැ ආටානාටිය දේශනාවට මුලින් කියන විහාර අස්න වශයෙනි. මෙය භවන පැරකුම්බා රජ දවස රචිත වූවෙකැයි සලකති. ඒ අතර ම ලක්දිව එවකට පැවැති ප්‍රධාන විහාරස්ථාන නාම මාලාව බෞද්ධයකු විසින් දතයුතු බැවින් ද මෙහි එන පරිදි යොදා ඇති වචන කියැවීම පහසු බැවින් ද හෝඩිය ළඟට ම මෙය කියවන දෙවෙනි පොත වශයෙන් භාවිත වූ බව පෙනේ. ඊළඟ තුන්වැනි පාඩම් පොතට ඇත්තේ මඟුල් ලකුණ ය. බුදුරජුන්ගේ අත්පාහි පිහිටි රේඛා පිරික්සන්නවුනට මතුවී පෙණුනු ලකුණු එයින් දැක්විණ. කතෘ සඳහන් නැතත් මේ දෙපොත් ම නරේන්‍ද්‍රසිංහ රාජ සමයට අයත් යැ යි සිතිය හැකිය.

බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය ස්ථවිර

# මඟුල් ලකුණ

ස්වස්තික දෙකය

සිරිවස දෙකය

නදවට දෙකය

සෝවැති දෙකය

අවතංස දෙකය

වඩ්මාන දෙකය

භද්‍රපීඨ දෙකය

ප්‍රාසාද දෙකය

තෝරණ දෙකය

ශ්වේතඡත්‍ර දෙකය

ඛඩ්ග දෙකය

තාලවෘන්ත දෙකය

මයුරහස්ත දෙකය

චාමර දෙකය

උෂ්ණීෂ දෙකය

මණී දෙකය

සුමනදාම දෙකය

නීලෝත්පල දෙකය

රක්තෝත්පල දෙකය

රක්තපද්ම දෙකය

ශ්වේතෝත්පල දෙකය

ශ්වේතපද්ම දෙකය

පුන්කළස් දෙකය

පූර්ණ පාත්‍ර දෙකය

සමුද්‍ර දෙකය

චක්‍රවාට පර්වත දෙකය

හිමවත් පර්වත දෙකය

මහාමේරු පර්වත දෙකය

සූර්යමණ්ඩල දෙකය

චන්ද්‍රමණ්ඩල දෙකය

සපරිවාර සතර මහා ද්වීප දෙකය

සපරිවාර සප්ත රත්න දෙකය

චක්‍රවර්ති රාජයෝ දෙ දෙනාය

දක්ෂිණාවෘත්ත ශ්වේතශංඛ දෙකය

සවර්ණ මත්ස්‍යයුගල දෙකය

චක්‍රායුධ දෙ කය

සප්ත මහා ගංගා දෙකය

සප්ත මහා සීදන්තසාගර දෙකය

සප්ත මහා ශෛල දෙකය

සප්ත මහා තටාක දෙකය

සුපණ්‍ණ රාජයෝ දෙ දෙනාය

සුංසුමාර රාජයෝ දෙ දෙනාය

ධ්වජ දෙකය

පතාකා දෙකය

සවණ්‍ණ පව්‍ත දෙකය

සවණ්‍ණ වාල විජනි දෙකය

කෛලාශ පව්‍ත දෙකය

සිංහරාජයෝ දෙ දෙනාය

ව්‍යාඝ්‍රරාජයෝ දෙ දෙනාය

වලාහක අශ්වරාජයෝ දෙ දෙනාය

උපෝසථ හස්ති රාජයෝ දෙ දෙනාය

වාසුකී නාගරජයෝ දෙ දෙනාය

හංස රාජයෝ දෙ දෙනාය

වෘෂභ රාජයෝ දෙ දෙනාය

ඓරාවන හස්ති රාජයෝ දෙ දෙනාය

ස්වණ්‍ණ මකර රාජයෝ දෙ දෙනාය

චතුර්‍මුඛ ස්වණ්‍ණ නෞකා දෙකය

වත්සක ධෙනුහු දෙ දෙනාය

කිම්පුරුෂයෝ දෙ දෙනාය

කින්නරාඞ්ගනාවෝ දෙ දෙනාය

කුරවීක රාජයෝ දෙ දෙනාය

මයුර රාජයෝ දෙ දෙනාය

ක්‍රෞංච රාජයෝ දෙ දෙනාය

චක්‍රවාක රාජයෝ දෙ දෙනාය

ජීවං ජීවක රාජයෝ දෙ දෙනාය

ෂඩ්විධ දිව්‍යලෝක දෙකය

ෂෝඩෂවිධ බ්‍රහ්මලෝක දෙකය

යනාදි දෙසිය සොළසක් මඞ්ගල ලක්‍ෂණයෝ බුදුරජුන්ගේ ශ්‍රීපාදතලයෙහි පිහිටා ඇත්හ.

මඟුල් ලකුණ නිමි.

පැරණි අකුරු කරවන පොත් පෙළ - 2